**ශීර්ෂය 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

**---------------------------------------------------------------------------------------------------------**

ශීර්ෂය 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත 2017 දෙසැම්බර් 28 දින නිකුත් කර ඇත. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**-------**

**2.1 විසර්ජන ගිණුම**

**-------------------**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

**---------------------------**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 337.79 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 333.76 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 4.03 ක් හෙවත් සියයට 1.2 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
| | රු. මිලියන | රු. මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 159.87 | 157.85 | 2.02 | 1.3 |
| මූලධන | 177.92 | 175.91 | 2.01 | 1.1 |
| එකතුව | 337.79 | 333.76 | 4.03 | 1.2 |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 20801 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 13.00 | 12.90 | 6.00 | 7.79 | 45.00 | 32.19 |

**2.3 අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වූ 7002/0000/00/0149/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.මිලියන 9.3 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම්**

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 03ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු. මිලියන 4.77 ක් විය. විස්තර පහත දැක්වේ.

| **පොදු තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු. |
| 6000/0000/00/001/0123/000 | 65,000 |
| 6000/0000/00/0016/0119/000 | 4,591,456 |
| 6000/0000/00/0002/0172/000 | 110,439 |
| එකතුව | 4,766,895 |

**2.5 විගණන නිරීක්ෂණය**

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

-------------------------------------------

දෙපාර්තමේන්තුවේ විසර්ජන සම්මත වැය ලෙජරය මුදල් රෙගුලාසි 447 ප්‍රකාරව විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

### 3.2 අග්‍රිම ගිණුම

--------------

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කෙරේ.

භාණ්ඩාගාර පරිගණක සටහන අනුව 2016 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ හර ශේෂය රු.9,282,458 ක් වන නමුත් විසර්ජන ගිණුමේ භාණ්ඩාගාර සටහන අනුව හෝ දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂයක් දක්වා නොතිබුණි.

### 3.3 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

----------------------------------------------------------------------

විෂය අංක 20801 දරන රජයේ නිලධාරීට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

දෙපාර්තමේන්තු පොත් අනුව රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුමේ වර්ෂය තුළ මුළු හර කිරීම්වල එකතුව රු.13,654,282 වන අතර භාණ්ඩාගාර පරිගණක සටහන් අනුව වර්ෂය තුළ මුළු හර කිරීම්වල එකතුව රු.14,096,713 ක් වේ. ඒ අනුව රු.442,431 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 3.4 වත්කම් කළමනාකරණය

-------------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් ඌනතාවයන් අනාවරණය විය.

#### (අ) කෞතුක භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

--------------------------------------------

කොළඹ කෞතුකාගාරයේ කෞතුක භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර ඇති නමුත් වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබූ අතර ප්‍රාදේශීය කෞතුකාගාරවල කෞතුක භාණ්ඩ සමීක්ෂණයක් 2017 ජුනි 30 දින වනවිටත් සිදුකර නොතිබුණි.

#### (ආ) පවරා නොගත් වත්කම් පරිහරණය කිරීම

------------------------------------------------

කොළඹ ජාතික කෞතුකාගාරය සහ මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය පිහිටි හෙක්ටයාර් 4.9282 ක භූමි ප්‍රමාණයන් සහිත ඉඩම්, දෙපාර්තමේන්තුව වෙත 2017 ජුනි 30 දින වනවිටත් පවරාගෙන නොතිබුණි. තවද ගාල්ල සමුද්‍ර කෞතුකාගාරය, ගාල්ල ජාතික කෞතුකාගාරය සහ ඕලන්ද යුග කෞතුකාගාරය පිහිටි ඉඩම් ප්‍රමාණයන් සඳහා පිඹුරුපත් ලබා ගැනීමට සහ පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.5 දේශිය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳ විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) ජාතික කෞතුකාගාරයේ ගිනි ආරක්ෂණ පද්ධතිය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2015 ඔක්තොබර් 14 දින කොළඹ පිහිටි පෞද්ගලික සමාගමට බදු රහිතව රු.17,968,550 ක මුදලකට ප්‍රදානය කර තිබුණි. මෙහි ඉදිකිරීම 2016 ජනවාරි 14 දින නිම කිරීමට එකඟ වී තිබුණ ද 2017 සැප්තැම්බර් මාසය අවසන් වන විටත් වැඩ නිමකර ජාතික කෞතුකාගාරයට භාරදීමට අපොහොසත් වී තිබුණි.

(ආ) රත්නපුර කෞතුකාගාරයේ නව වැසිකිළි පද්ධතිය ඉදිකිරීම් කටයුතු සබරගමුව පළාත් සභාවේ ප්‍රාදේශීය ඉංජිනේරු සේවා කාර්යාලය වෙත පවරා තිබුණි. 2014 නොවැම්බර් 19 දින ප්‍රාදේශීය ඉංජිනේරු සේවා කාර්යාලය විසින් ඇස්තමේන්තු සකස් කර අනුමත කරගෙන තිබුණි. මේ සඳහා කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් සබරගමුව පළාත් ප්‍රාදේශීය ඉංජිනේරු සේවා කාර්යාලය වෙත රු. 1,858,000 ක් අවස්ථා තුනකදී ගෙවා තිබූ නමුත් 2017 සැප්තැම්බර් මාසය වනවිටත් එහි කටයුතු අවසන් කර නොතිබුණි.

**3.6 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දින වනවිට වර්ෂයක කාලයක් පැවති, බැංකුවට ඉදිරිපත් නොකළ වටිනාකම රු. 130,162 ක චෙක්පත් 6 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) ඉදිකිරීමේ කාර්යයන් 4 ක් වෙනුවෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු නමින් රු. 27,495,771 ක් වටිනා චෙක්පත් 10 ක් ලියා ඒවා එම ආයතනවලට භාර නොදී 2017 මැයි මාසය වන විටත් රඳවාගෙන තිබුණි. එම ගෙවීම්වලට අදාළ වැඩ සත්‍ය වශයෙන්ම ඉටුකර නොතිබියදී මෙම චෙක්පත් ලියා ඒවායේ වටිනාකම සදොස් ලෙස විසර්ජන ගිණුමේ වියදම් ලෙස වාර්තා කර ඇති බව නිරීක්ෂණය විය.

**3.7 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි බාහිර පාර්ශවයන් වෙත කුලියට ලබා දීම සම්බන්ධයෙන් සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) පැරණි ආපනශාලා ගොඩනැගිල්ල බදුදීම

(i) කෞතුකාගාර දෙපාර්තමේන්තුවට අයත් වර්ග අඩි 8000 ක් පමණ වූ පැරණි ආපනශාලා ගොඩනැගිල්ල ලක්සල තෑගි සහ සැමරුම් භාණ්ඩ අලෙවිසැලක් පවත්වා ගැනීම සඳහා මාසිකව රු.25,000 ක කුලියකට ලක්සල ආයතනයට ලබා දී තිබුණි. එසේ වුවද රජයේ තක්සේරුකරු විසින් එම ගොඩනැගිල්ල සඳහා මාසික කුලිය රු.801,000 ක් ලෙස වාර්තා කර තිබූ බැවින් 2016 වර්ෂය සඳහා කුලී ආදායම රු.9,312,000 ක් අඩුවෙන් අයවී තිබුණි.

(ii) ලක්සල ආයතනය විසින් ගිවිසුම් කොන්දේසිවලට පටහැනිව එම ගොඩනැගිල්ලේ වර්ග අඩි 500 ක පමණ ප්‍රමාණයක් බීම සහ ආහාරපාන වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහා පෞද්ගලික ආයතනයකට මාසිකව රු. 100,000 ක් සහ එම ආයතනයේ වැඩි වන පිරිවැටුම මත සියයට 7.5 සිට සියයට 25 දක්වා වූ කුලියකට යටත්ව අතුරු බදු දී තිබුණි.

(ආ) **කොළඹ කෞතුකාගාරයේ ආපනශාලාව බදුදීම**

කෞතුකාගාර දෙපාර්තමේන්තුව සතු ආපනශාලාව සුබසාධක සංගමය විසින් මාසිකව රු.16,000 ක කුලියකට බාහිර පාර්ශවයක් වෙත බදු දී තිබුණද මුළු ආදායම දෙපාර්තමේන්තු ආදායමට බැර කිරීම වෙනුවට මාසිකව රු.6,000 ක කුලියක් පමණක් දෙපාර්තමේන්තු ආදායමට හා ඉතිරි රු.10,000 සුභසාධක සංගමයේ ආදායමට බැර වී තිබුණි.

## 3.8 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2012 මාර්තු 16 දින කොළඹ ජාතික කෞතුකාගාරයේ සිදු වූ සොරකම නිසා අස්ථානගතව තිබූ කෞතුක භාණ්ඩ ප්‍රමාණය 221 ක් වූ අතර එම භාණ්ඩ රු.4,440,140 කට තක්සේරු කර තිබුණි. ඉන් භාණ්ඩ 94 ක් මුල් තත්ත්වයෙන්ම ද තවත් භාණ්ඩ කිහිපයක් කොටස් වශයෙන් හා වටිනා ගල් වර්ග වශයෙන් ඒකක 57 ක් නැවත හමු වී තිබූ අතර ඉතිරි භාණ්ඩ විනාශයට පත්වී තිබුණි. 2017 ජූනි මාසය වන විටත් එම භාණ්ඩ නඩු භාණ්ඩ වශයෙන් අධිකරණයේ පවතින බව වැඩබලන කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ආ) රත්නපුර කෞතුකාගාර භූමියේ පිහිටි කෞතුකාගාර අධිකාරි නිල නිවස අලුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන සබරගමුව පළාත් ඉංජිනේරු සේවා කාර්යාලය මගින් 2013 වර්ෂයේදී රු. 1,079,000 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර අනුමත කර තිබුණි. ඇස්තමේන්තු පිළියෙල කර වසර 04 ඉක්ම ගියද අලුත්වැඩියා නොකළ මෙම ගොඩනැගිල්ල 2017 ජූලි මාසය වන විට දිරාපත් වෙමින් පැවති අතර 2017 වර්ෂයේදී අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කරවා ගෙන නොතිබුණි.

## 3.9 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 1942 අංක 31 දරන ජාතික කෞතුකාගාර ආඥා පනත පරිච්ඡින්න කර ශ්‍රී ලංකාවේ වර්තමාන හා අනාගත අවශ්‍යතාවයන්ට අනුරූප වන අයුරින් නව පනතක් නිර්මාණය කිරීමේ අරමුණින් 2014 අගෝස්තු 29 දිනැති අංක 14 / 1269/ 555/010 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර තිබුණි. එය සාකච්ඡා කිරීමෙන් පසු ලබාදෙන ලද නියමයන්ට අනුව නීතිපති දෙපාර්තමේන්තුව මගින් සංශෝධන සිදුකර 2015 ජූලි 07 දින වන විට අවසන් කර තිබුණි. 2017 මැයි මාසය වන විටත් නව පනත සම්මත කර ගැනීමේ කාර්යභාරය අවසන් නොවීම හේතුවෙන්, වර්තමාන හා අනාගත අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු ප්‍රමාද වී තිබුණි.

(ආ) රත්නපුර කෞතුකාගාර ප්‍රධාන ගොඩනැගිල්ල සහ පිට ගෙය නමින් හැඳින්වෙන ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ කටයුතු සබරගමුව පළාත් සභාවේ ඉංජිනේරු සේවා කාර්යාලය වෙත පවරා තිබුණි. මේ සඳහා රු. 5,771,000 ක් වූ ඇස්තමේන්තුව අනුමත කර 2015 ඔක්තෝම්බර් 26 දින කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණි. 2015 වර්ෂයේදී ප්‍රාදේශීය ඉංජිනේරු සේවා කාර්යාලය වෙත රු. 5,771,000 ක මුළු මුදලම ගෙවා තිබුණු නමුත් පිටගෙය ගොඩනැගිල්ලේ පමණක් රු. 1,949,194 කට අලුත්වැඩියාවන් සිදුකර තිබුණි. කෙසේ වුවද එම අලුත්වැඩියාවන් ද ඉතා දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) කොළඹ කෞතුකාගාරයේ ආරක්ෂිත කැමරා (CCTV) පද්ධතියේ උපස්ථක (Backup) පවත්වාගෙන යනු ලබන්නේ සේවා පරිගණකය (Server) සමඟ එක් ස්ථානයක පමණක් වන අතර මෙම ස්ථානයේ ගිනි නිවන උපකරණ ද සවිකර නොතිබුණි.

(ඈ) වඩු මඩුව පිහිටි කෞතුකාගාර මායිම් ප්‍රදේශයේ සෙවිලි තහඩු යොදාගෙන සාදා තිබූ කුටි බාහිර පාර්ශවයන් විසින් භාවිතා කරන බව විගණනයට නිරීක්ෂණය විය.

(ඉ) කෞතුකාගාරය නැරඹීම සඳහා දිනකට පාසල් සිසුන් ඇතුළු 800 දෙනෙකුට අධික සංඛ්‍යාවක් පැමිණියද ඔවුන්ට ආහාර ගැනීම සඳහා වූ භෝජනාගාරයේ පැවතිය යුතු අවම පහසුකම් හෝ නොතිබුණ හෙයින් ඔවුන්ට තණ භූමියේ සිට ආහාර අනුභව කිරීමට සිදුවී තිබෙන බව 2017 මාර්තු 08 දින ස්ථානීය විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

### (ඊ) පුස්තකාලයේ පැවති අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පුස්තකාලයේ ඇති පොත් පරිගණක ගත කිරීමේ ප්‍රමාදයක් සිදු වී ඇති බව විගණනයට නිරීක්ෂණය විය. පුස්තකාලයේ පරිග්‍රහණ ලේඛනයට ඇතුළත් කර තිබූ පිටු 100 ට වැඩි පොත් ගණන 162,620 ක් සහ පිටු 100 ට අඩු පොත් ගණන 40,338 ක් වුවත් ඉන් පරිගණක ගත කර තිබූ පොත් ගණන

35,457 ක් බව 2017 මාර්තු 08 දින සිදුකරන ලද විගණන පරීක්ෂණයේදී අනාවරණය විය.

(ii) වසර ගණනාවක සිට පුස්තකාලය නඩත්තු කටයුතු සහ අවශ්‍ය අලුත්වැඩියා කටයුතු සිදු කර නොතිබුණි.

(iii) පුස්තකාලයේ ඇතුළත සහ පිටත ආරක්ෂිත කැමරා පද්ධතියක් (CCTV) ස්ථාපනය කර තිබුණද නැරඹුම් මැදිරියට සම්බන්ධ කර නොතිබුණි.

(iv) දැනට අංකිතකරණය (Digital) කර පුස්තකාලයට ලබා දී ඇති පුස්කොළ පොත් 80 ක්, දුර්ලභ පොත් 15 ක් සහ 1924 - 1925 වර්ෂවල ගැසට් පත්‍ර යනාදිය පාඨකයින්ට පරිශීලනය කිරීම සඳහා අවශ්‍ය පරිගණක ස්ථාපනය කර නොතිබුණි.

(උ) **කොළඹ කෞතුකාගාරයේ සංරක්ෂණ අංශයේ අඩුපාඩු**

---------------------------------------------------------

සංරක්ෂණ අංශයට ගිනි ආරක්ෂණ පද්ධතියක් (Fire Alarm System) හා ආරක්ෂක කැමරා පද්ධතියක් (CCTV) සවිකර නොතිබුණි.

(ඌ) **කෞතුකාගාරයේ ප්‍රකාශන අංශයේ අඩුපාඩු**

---------------------------------------------

(i) ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදය අනුව ISBN අංක ලබා ගැනීම සඳහා මුද්‍රණය කරනු ලබන සියළුම පොත් හා ප්‍රකාශන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ලියාපදිංචි කල යුතු වුවද කෞතුකාගාර ප්‍රකාශන අංශයේ මුද්‍රණය කරනු ලබන ප්‍රකාශන එලෙස ලියාපදිංචි කර නොතිබුණි.

(ii) ප්‍රකාශන අංශයෙන් නිකුත් කරනු ලබන පොත්වල මිල සහ තීරු කේතය (Bar code) සඳහන් කර නොතිබුණි. ඒ හේතුවෙන් මෙම ප්‍රකාශන නැවත විකුණනු ලබන ආයතන විසින් ඉහළ මිල ගණන්වලට විකිණීමට ඉඩකඩ ඇති බව විගණනයට නිරීක්ෂණය විය.

**3.10 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

----------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 06 | 09 |
| තෘතියික මට්ටම | 04 | 02 | 02 |

| | | | |
|---|---|---|---|
| ද්විතියික මට්ටම | 123 | 72 | 51 |
| ප්‍රාථමික මට්ටම | 258 | 190 | 68 |
| එකතුව | 400 | 270 | 130 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුස්තකාලයේ සිටිය යුතු කාර්යය මණ්ඩලය 07 වුවත් දැනට සේවයේ යෙදී සිටින්නේ 04 දෙනෙකු පමණි. ඒ අනුව පවතින ඇබෑර්තු 3 පිරවීම සඳහා වර්ෂ ගණනාවක සිට ක්‍රියාකර නොතිබුණි. සේවක හිඟය නිසා ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙන් සංරක්ෂණය සඳහා ලැබෙන පොත් පරිග්‍රහන ලේඛනයට ඇතළත් කිරීමේදී වර්ෂ දෙකකට ආසන්න ප්‍රමාද කාලයක් වාර්තා වී තිබුණි. එබැවින් මෙම පොත් පරිශීලනය කිරීමට අවුරුදු දෙකකට ආසන්න කාලයක් ගතවන බව නිරීක්ෂණය විය.

(ආ) කොළඹ කෞතුකාගාරයේ 2012 මාර්තු 16 දින සිදු වූ කෞතුක භාණ්ඩ සොරකම සහ 2014 නොවැම්බර් 16 දින රාත්‍රියේ සිදු වූ අනවසර ඇතුළුවීම වැනි සිදුවීම් මත කෞතුකාගාරයේ ආරක්ෂාව පිළිබඳ ගැටළු පැවතියද, 2013 මැයි 23 දින අනුමතකර තිබූ ප්‍රධාන ආරක්ෂක නිලධාරී තනතුර ද, කෞතුකාගාර ආරක්ෂක (curator) තනතුරු 10 න් 06 ක් ද, ආරක්ෂක සහකාර තනතුරු 05 ක් ද 2016 දෙසැම්බර් 31 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලයට තාක්ෂණික නිලධාරි දෙදෙනකු ඇතුළත් වුවද මේ දක්වා එම පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබුණි. එබැවින් ආරක්ෂිත කැමරා පද්ධතියේ තාක්ෂණික කටයුතු එය ස්ථාපනය කළ සමාගම් නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ පවත්වා ගැනීමට සිදුවී ඇත.